පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

ලංකා ඩීවර සංස්ථාව

2022.11.25

(2023.12.31 දිනට ප්‍රගතිය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - ලංකා ධීවර සංස්ථාව 2022-11-25

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
02.	ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම	i. උක්ත සඳහන් කරන ලද 2016.08.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කිරීම. ii.2016 වසරේ ගනු ලැබූ කැබිනට් තීරණය, වත්මන් අමාත්‍ය මණ්ඩලය විසින් නැවත තහවුරු කිරීමට සති දෙකක් ඇතුළත පියවර ගැනීම. iii. අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) කැඳවීම සම්බන්ධව සහ කැබිනට් මණ්ඩලය දැනුවත් කිරීම සම්බන්ධව ප්‍රගතිය මාස දෙකක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.	රාජ්‍ය,පෞද්ගලික හවුල්කාරිත්වය(PPP) යටතේ ධීවර සංස්ථාව ඉදිරි ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු වලට අදාලව අමාත්‍ය මණ්ඩලය වෙත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.	මේ සම්බන්ධව ගරු ධීවර අමාත්‍යතුමා දැනුවත් කර, අදාල උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින අතර තවද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ලැයිස්තුවට ද මෙම ආයතනය ඇතුළත් කර ඇත .

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
03.	ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම	i.නව ආයතනික සැලැස්ම සකස් කිරීමට නොපමාව කටයුතු කිරීම සහ මාස තුනක් ඇතුළත ප්‍රගතිය පිළිබඳ කාරක සභාවට වාර්තා කිරීම.	මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. කෙටුම්පත ද ඉදිරිපත් කර ඇත.	කෝප් කමිටුවේ සාකච්ඡාවට බඳුන් වූ උක්ත කරුණට අදාලව ලංකා ධීවර සංස්ථාව විසින් ඉදිරිපත් කර තිබූ සංයුක්ත සැලැස්මේ පැවති දුර්වලතාවයන් සහ ප්‍රායෝගික නොවන කරුණු හේතුවෙන් එම සංයුක්ත සැලැස්ම ඉවත් කර 2024/25 හා 26 වර්ෂයන් 03 සඳහා සංයුක්ත සැලැස්මක් මේ වන විටත් කෙටුම්පත් කර ඇත. එම කෙටුම්පත් කරන ලද සංයුක්ත සැලැස්ම පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 02 කදී සාකච්ඡාවට බඳුන් විය. එහිදී සංශෝධනය වූ කරුණු හා මේ වන විටත් ආයතනයේ ඉහළ කළමනාකරණ තනතුරු සඳහා බඳවා ගන්නා ලද සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා අංශ ප්‍රධානීන්ගෙන් ද දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ ද අදහස් හා යෝජනා එකතු කර යළි සංශෝධනය කර ඉතා කඩිනමින් 2024 වර්ෂයේ පළමු හෝ දෙවන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර එහි අනුමැතියෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. 2024 වර්ෂයට අදාලව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.(ඇමුණුම 01 - 2024 ක්‍රියාකාරී සැලැස්ම)
04.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්			මසකට එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් බැගින් පැවැත්වීමට පසුගිය වර්ෂය තුළ කටයුතු කර ඇත. අවශ්‍ය විශේෂ අවස්ථා වලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්ද පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
05.	Sailfish (තලපත්) සඳහා අදේශකයක් හඳුන්වා දීම	i.රජයේ රෝහල් වල නේවාසික රෝගීන්ගේ ආහාර සඳහා, තලපත් මාළු වෙනුවට දේශීය මාළු සැපයීමේ හැකියාව පිළිබඳව, වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අදහස් හා උපාය මාර්ග වලින් සමන්විත වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.	සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඇති අතර එම නිර්දේශ මත දේශීයව ලබා ගත හැකි ආදේශනයන් සැපයීමට අපේක්ෂිතය.	ලංකා ධීවර සංස්ථාව මගින් දීප ව්‍යාප්තව පිහිටා ඇති මධ්‍යම රජය විසින් පරිපාලනය වන රෝහල් හා පළාත් සභා මගින් පාලනය වන මූලික රෝහල් සඳහා නේවාසික රෝගීන් වෙනුවෙන් ආහාර සඳහා මත්ස්‍ය සැපයුම සිදු කරන අතර මෙහිදී බොහෝ රෝහල් සඳහා ඇණවුම් ලෙස ලබා දෙන්නේ තලපත් මසුන්ය. දේශීය මත්ස්‍ය නිෂ්පාදනයෙන් ලබා ගන්නා තලපත් මසුන් ප්‍රමාණය කිසිසේත්ම දේශීය මත්ස්‍ය පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නොවන අතර වාර්ෂිකව ඉතා විශාල තලපත් හා කොප්පරා මසුන් ප්‍රමාණයක් ආනයන කිරීම සිදු කරනු ලබයි. ලංකා ධීවර සංස්ථාවටද තම රෝහල් මසුන් ඇණවුම සඳහා ප්‍රමාණවත් තලපත් මසුන් දේශීයව ලබා ගැනීමට නොහැකි අතර ආනයනය කරන ලද මසුන් පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමට සිදුව ඇත. ආදේශකයන් සැපයීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඇති අතර 2022.10.20 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශ ලිපිය මගින් රෝහල් වලට සැපයිය හැකි ආදේශක මසුන් වර්ග සඳහන් කර ඇත. ඇතැම් රෝහල් සඳහා ආදේශකයන් භාර ගැනීම සිදු නොකරන බැවින් 2023 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව විසින් සෘජු මත්ස්‍ය ආනයනය කිරීම මගින් සහ 2024 වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්ම හරහා ආනයනය කිරීමට බලාපොරොත්තු වන තලපත් මසුන් බහාලුම් ප්‍රමාණය මගින් මෙම ගැටළුව විසඳා ගැනීමට අපේක්ෂිතය. (ඇමුණුම 02 - 2022.10.20 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලිපිය)

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	**2023.01.30** දිනට ප්‍රගතිය	**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)**
				එසේ වුවද මේ පිළිබඳව නැවත වරක් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමටද අපේක්ෂිතය.
06.	සංස්ථාවේ කාර්ය මණ්ඩලය	i. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව අදාල බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ මාස දෙකක් ඇතුළත ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීම.	ප්‍රධාන තනතුරු බඳවා ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රේඛීය අමාත්‍යාංශය මඟින් 2022.11.04 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ඉල්ලා ලිපි යොමු කර ඇති අතර එම නිර්දේශයන් ලද වහාම 2023 පළමු කාර්තුව තුළ මෙම බඳවා ගැනීම් සිදු කර අවසන් කිරීමට අපේක්ෂිතය.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු තනතුරු 04 සඳහා සුදුසු නිලධාරීන් බඳවාගෙන ඇත. තවද සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 2023.08.02 දින ස්ථිර පදනමින් බඳවා ගෙන ඇත. ද්විතික මට්ටමේ තනතුරු වලට බඳවා ගැනීම සඳහා 2023.12.06 දින දරන 1063 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී.
07.	ණය අයකර ගැනීම	i.ණය ගැතියන් නිවැරදිව හඳුනා ගැනීමේ පහසුව සඳහා ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම. ii. ණය ගැතියන්ගේ සහ ණය හිමියන්ගේ ලේඛනයක් සකස් කර, සති තුනක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.	2022.12.12 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා පත්‍රිකාවක් ලෙස ඉදිරිපත් කර ඇත.	• සංස්ථා ණය එකතු කර ගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කර ගැනීම සඳහා මේ වන විටත් පුළුල් වූ අවධානයක් යොමු කර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය යටතේ උප ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන ණය එකතු කර ගැනීමේ අංශය තව දුරටත් ශක්තිමත් කර ගනිමින් සියලු දිස්ත්‍රික් කාර්යාලයන් හා ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශයන් ආවරණය වන පරිදි එක් නිලධාරියකු

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
				ණය එකතු කර ගැනීම සඳහා පත් කර ගැනීමටත්, එම නිලධාරීන් සෘජු අධීක්ෂණය කිරීමේ හා කාර්යයන් පැවරීමේ අධිකාරියක් ණය එකතු කර ගැනීමේ අංශය වෙත පැවරීමටත් දැනට කටයුතු යොදා ඇත. • එසේම, විධායකයන් හා මෙහෙයුම් අංශ විසින් ණය පදනමින් මසුන් බාහිර ආයතන වෙත සැපයීමේදී ආරක්ෂිත තැන්පතු තබා ගැනීම මෙන්ම ලිඛිත ගිවිසුම් ඇති කර ගනිමින් මසුන් ණයට විකිණීම සිදු කළ යුතු බවට නව චක්‍රලේඛන නිකුත් කිරීමටත් විධායක වල අභ්‍යන්තර ණයගැතියන්ගේ ණය ශේෂ සම්බන්ධ වගකීම අදාල කළමණාකරුවන් වෙත පැවරීම සඳහා පැවති චක්‍රලේඛ සංශෝධනය කර නව චක්‍රලේඛනයක් නිකුත් කිරීමටත් අදාල කෙටුම්පත් මේ වන විටත් සකස් කර ඇත. (ඇමුණුම 03) • අභ්‍යන්තර දිගු කාලීනව පවතින ණය ශේෂ සම්බන්ධව එම වෙළඳ සහයකයන් සඳහා නෛතික හා විනය ක්‍රියාමාර්ග ගැනීම දැනටමත් ආරම්භ කර ඇති අතර එමගින් මිලියන 19ක ණය ශේෂ අයකර ගෙන ද ඇත. ආයතනයේ සේවක මහත්ම මහත්මීන් වෙළඳ සහකයන් ලෙස අනුයුක්ත කර ගැනීමේදී මූල්‍යමය කටයුතු සිදු කර ගැනීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුවක් ඔවුන්ගෙන් ලබා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර කටයුත්තක් වී ඇති අතරම

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
				විගණකාධිපතිගේ නිර්දේශය පරිදි ඔවුන් ආයතනයේ ණය ගැතියන් ලෙස දැක්වීම ගැටළු සහගත තත්වයක් බව ලංකා ධීවර සංස්ථාව ද පිළිගන්නා නමුදු මසුන් නිකුත් කිරීමේදී හා මුදල් රැස් කිරීමේදී ඒවා ගිණුම් ගත කිරීම සඳහා වෙළඳ ණයගැතියන් (අභ්‍යන්තර) ලෙස පවත්වා ගෙන යාමට සිදු වන බව සඳහන් කළ යුතුය. වර්තමානයේදී මාසික අලෙවි කටයුතු හා මුදල් බැංකු ගත කිරීම් නිසි පරිදි යාවත්කාලීන වන අතර තව දුරටත් පැරණි ණය ශේෂ අයකර ගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කර ගැනීමේ කටයුතු ඉහළ කළමණාකාරිත්වයේ මැදිහත් වීමෙන් සිදු කරමින් පවතී. • විධායක ණය ශේෂයන් නිසි පරිදි යාවත්කාලීන කිරීම හා තොරතුරු එක්රැස් කිරීමේ කාල ප්‍රමාදයට පිළියමක් ලෙස පරිගණකගත මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීම 2024 මුල් කාර්තුව තුළ ඉටු කර ගැනීමට අපේක්ෂිත ය. (ඇමුණුම 04 - 2023.12.31ක දිනට යාවත්කාලීන කරන ලද ණයගැතියන්ගේ හා ණයහිමියන්ගේ ලේඛන.)
08.	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම	i.මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.	2022.12.12 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා පත්‍රිකාවක් ලෙස ඉදිරිපත් කර ඇත.	2017 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර සභාගත කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2018 මූල්‍ය ප්‍රකාශන මේ වන විටත් ජාතික විගණන කාර්යාලය වෙත ලබා දී එය විගණනය කර කෙටුම්පත් කළමනාකරණ වාර්තාව සංස්ථාව වෙත ලබා දී ඇත. එසේම 2019/20/21/22 වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශන ද කෙටුම්පත් කර ඇති අතර එම කෙටුම්පත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

<table>
<tr><th>අනු අංකය</th><th>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</th><th>කාරක සභාවේ නිර්දේශ</th><th>2023.01.30 දිනට ප්‍රගතිය</th><th>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td>අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටුවේ ද සාකච්ඡා වූ පරිදි මෙම පසුගිය මූල්‍ය ප්‍රකාශන ඉතා කඩිනමින් විගණනය කර ගැනීම සඳහා විගණකාධිපති වෙත ඉල්ලීමක්ද 2023.12.25 දින සිදු කරන ලදී. ඊට අදාළ සැලැස්ම පහත පරිදි වේ.
<table>
<tr><th>මූල්‍ය වාර්තාව</th><th>ජාතික විගණන කාර්යාලය වෙත විගණනය සඳහා භාර දීම</th><th>විගණනය කරන ලද වාර්තාව ලබා ගැනීම</th><th>සභාගත කිරීම</th></tr>
<tr><td>2017</td><td>2021.03.09</td><td>2022.10.10</td><td>2024.02.29</td></tr>
<tr><td>2018</td><td>2023.11.13</td><td>2024.01.26</td><td>2024.03.30</td></tr>
<tr><td>2019</td><td>2024.03.15</td><td>2024.04.30</td><td>2024.05.20</td></tr>
<tr><td>2020</td><td>2024.05.15</td><td>2024.06.30</td><td>2024.07.15</td></tr>
<tr><td>2021</td><td>2024.07.20</td><td>2024.08.30</td><td>2024.09.20</td></tr>
<tr><td>2022</td><td>2024.09.15</td><td>2024.10.15</td><td>2024.10.30</td></tr>
</table></td></tr>
<tr><td>09.</td><td>සේවක අර්ථසාධ අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිඟ දායක මුදල්</td><td>i.හිඟදායක මුදල් පියවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ක්‍රමවේදය පිළිබඳ වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.</td><td>ආයතනය ලාභදායී තත්ත්වයට පත් කර ගනිමින් මාසිකව නිසි පරිදි අදාල මුදල් ගෙවීමටත් ,හිඟ මුදල් සම්බන්ධයෙන් ගරු අමාත්‍යාතුමා වෙත ලිඛිත ඉල්ලීමක් කර කැබිනට් පත්‍රිකාවක් මගින් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට හෝ මහා භාණ්ඩාගාර</td><td>ලංකා ධීවර සංස්ථාව පසුගිය වර්ෂ ගණනාවක් පුරාවට බොහෝ විධායකයන් අලාභදායීව පැවතීමත් ප්‍රධාන කාර්‍යාලය පවත්වාගෙන යාම සඳහා විශාල මධ්‍යම පරිපාලන වියදමක් දැරීමට සිදු වීමත් මත මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම වෙළඳ හා අනිකුත් සැපයුම්කරුවන් සඳහා මුදල් නොගෙවීම මත විශාල හිඟ ශේෂයන් පවතින අතර සංස්ථාව සතු ජංගම වත්කම් ප්‍රමාණය මෙන් හතර ගුණයක් වූ ජංගම වගකීම් ප්‍රමාණයක් පියවීමට ඇත. 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොටස් වශයෙන් හා සම්පූර්ණ වශයෙන් සේවක අර්ථ සාධක මුදල් ගෙවීමට ඇති අතර සේවක භාරකාර අරමුදලට ද සුළු ප්‍රමාණයක් ගෙවීමට ඇත. වර්තමානයේදී අධිකරණමය නියෝගයක් මත මෙම හිඟ ශේෂයන් සඳහා මුදල් ගෙවීම් සිදු කරන අතරම 2022 වර්ෂයේ අග සිට මාසිකව මෙම දායක මුදල් සඳහා නිසි පරිදි ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි.</td></tr>
</table>

අනු අංකය	සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු	කාරක සභාවේ නිර්දේශ	2023.01.30 දිනට ප්‍රගතිය	වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම (2023.12.31 දිනට)
				2024 වර්ෂයේදී ආයතනය විසින් අපේක්ෂා කරන පරිදි සංස්ථාවට අයවිය යුතු හිඟ කුලී මුදල් සහ වර්ෂ කිහිපයක සිට ප්‍රයෝජනයට ගත නොහැකි අබලි ද්‍රව්‍ය විවෘත ටෙන්ඩර් කිරීම මගින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ද මෙම හිඟ අරමුදල් සඳහා යෙදවීමට අපේක්ෂිතය. ධීවර සංස්ථාව විසින් ධීවර අමාත්‍යාංශය වෙතද මෙම අරමුදල් ගෙවීම සඳහා යම් සහනදායී වැඩ පිළිවෙලක් යොදවන ලෙසත්, දිගුකාලීන බැංකු ණයක් ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශයන් හා මග පෙන්වීම් සිදු කරදෙන ලෙසටත් දැනටමත්ම ලිඛිතව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

කේ.එන්. කුමාරි සෝමරත්න
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10.

කේ.එන්.කුමාරි සෝමරත්න
ලේකම්,
ධීවර අමාත්‍යාංශය

6/3/24

ඩග්ලස් දේවානන්දා
ගරු අමාත්‍ය,
ධීවර අමාත්‍යාංශය

Douglas Devananda M.P
Jaffna Electoral District
Secretary General, EPDP
Minister Of Fisheries
New Secretariat, Maligawatta, Colombo 10